# 5 ශ්‍රාවකත්වයට කැඳවීම

**ශු. ලූක් 5:1-11, 5:27-32, 6:12-16**

ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් හා ජීවිතාදර්ශය ගැන පැහැදුනු බොහෝ දෙනා උන්වහන්සේගේ ශ්‍රාවකයන් බවට පත්වූහ. මෙහි දී ජේසුස් වහන්සේ තම මෙහෙවර වඩාත් ශක්තිමත් ව ඉදිරියට ගෙන යෑම උදෙසා ඒ අතරින් දෙළොස් දෙනෙකු ප්‍රේරිතයන් ලෙස තෝරා ගත් සේක. එම ශ්‍රාවකයන් තෝරා ගත් ආකාරයත්, එම ක්‍රියාවලිය මගින්, ජේසුස් වහන්සේගේ මෙහෙවර උදෙසා දායක වීමට අපගේ ජීවිත කෙලෙස සකස් විය යුතු ද යන්න විමසා බැලීමටත් මෙම පාඩම යොමු වේ.

අන්තෝනි මාමාට අයත් බෝට්ටුව සුපුරුදු පරිදි වෙරළෙහි නවතා තිබිණි. වෙන දා සේ ම ශුද්ධ බයිබලය අධ්‍යයනය කිරීම සඳහා සුමුදු අක්කාත් ළමයින් පිරිසත් බෝට්ටුව තුළ අසුන් ගත්තේ රටාවකට මෙනි. වෙන දා මෙන් නොව අද සුමුදු අක්කා අත ශුද්ධ බයිබලයට අමතර ව තවත් කාඩ්පත් කිහිපයක් තිබිණි. "සුබ සැන්දෑවක් හැම දෙනාට ම" කියමින් සුමුදු අක්කා සුපුරුදු පරිදි ආචාර කළ අතර, ළමයි එයට පිළිවදන් දුන්හ. සුමුදු අක්කා ගෙනැවිත් තිබූ කාඩ්පත් අතුරෙන් එකක් ගෙන එය ළමයින් ඉදිරියේ ප්‍රදර්ශනය කළා ය.

**"දේව කැඳවීම"** යනුවෙන් එහි ලියා තිබිණි.

කුමක් ද මේ දේව කැඳවීම? දේව මෙහෙවරෙහි විශේෂ කාර්යයන් උදෙසා දෙවියන් වහන්සේගේ තෝරා ගැනීම දේව කැඳවීමයි. අද අප විමසා බලන්නට යන්නේ එලෙස විශේෂ කැඳවීම් ලද කිහිප දෙනෙකු පිළිබඳ ව යි,

**විමසුමට**
**ශු. බයිබලයෙන්**
**ශු. ලූක් 5:1-11**



5.1 රූපය - පළමු ශ්‍රාවකයන් කැඳවීම

| | |
|---|---|
| ස්ථානය : | ගෙනසෙරෙත් විල හෙවත් ගලීලයේ මුහුද |
| අවස්ථාව : | ජේසුස් වහන්සේ සීමොන්ගේ ඔරුවට නැග අනුශාසනා කළ අවස්ථාව |
| පසුබිම : | සීමොන් ඇතුළු ධීවරයන්, රැයක් පුරා වෙහෙස වුව ද එක් මත්ස්‍යයකුවත් අල්ලා ගැනීමට නොහැකි වීම |
| ජේසුස් වහන්සේගේ ඉල්ලීම : | දියඹට ගොස් දැල් හෙළන ලෙස |
| සීමොන්ගේ ප්‍රතිචාරය : | ජේසුස් වහන්සේට කීකරු වී නැවත දැල් හෙළීම |
| අත්දැකීම : | දැල් ඉරෙන තරමට මසුන් රාශියක් අල්ලා ගැනීම |
| සීමොන්ගේ ඊළඟ පියවර : | ජේසුස් වහන්සේගේ පාමුල දණින් වැටී තම පව්කාර ස්වභාවය පිළිබඳ ව උන්වහන්සේට පැවසීම. |
| ජේසුස් වහන්සේගේ ප්‍රතිචාරය : | මෙතැන් පටන් ඔබ මිනිසුන් දිනනු ඇත" යනුවෙන් පවසා සිය "මෙහෙවර උදෙසා ඔහු කැඳවීම. |

"මේ විශේෂ කැඳවීම මගින් අපට ලද හැකි අත්දැකීම් මොනවා ද?" සුමුදු අක්කා විමසුවා ය. "අපගේ ජීවිතයේ ඕනෑ ම මොහොතක දේව කැඳවීම ලැබිය හැකියි." එසේ පැවසුවේ මහෙල් ය. දේව කැඳවීමට කීකරු වීම අපගේ වගකීම බව චතුර පැවසී ය.

"සමහර විට ප්‍රාතිහාර්යයක අත්දැකීම තුළ මෙන් ම බලාපොරොත්තු කඩ වූ අවස්ථාවල දී පවා දේව කැඳවීම ලැබිය හැකියි." දෙව්ශානි පැවසුවා ය.

"අපගේ වැරදි ක්‍රියා ඒත්තු ගෙන, ඒ පිළිබඳ ව පසුතැවිලි වීමෙන් දේව කැඳවීමට ප්‍රතිචාර දැක්වීම සුදුසු බව ගීතානි කීවා ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

"ඔව්, ඔයාලාගේ අදහස් ඉතා අගෙයි, මා එකතු කරන්නම් තවත් අදහසක්" සුමුදු අක්කා පැවසුවා ය. "ජේසුස් වහන්සේගේ ශුද්ධත්වය තුළ අපගේ නොවටිනා බව අවබෝධ කර ගනිමින්, සියල්ල අතහැර දේව කැඳවීමට ප්‍රතිචාර දක්වීමයි අප කළ යුතු වන්නේ."

හොඳයි අපි තවත් එවැනි ම විශේෂ දේව කැඳවීමක් ලද කෙනෙකු ගැන විමසා බලමු.

**විමසුමට**
**ශු. බයිබලයෙන්**
**ශු. ලූක් 5:27-32**

| | |
|---|---|
| ලෙවී හෙවත් මතෙව් හමුවන්නේ : | බදුපොළේ දී |
| ලෙවීගේ රැකියාව : | අයකැමි හෙවත් බදු අය කිරීම |
| ජේසුස් වහන්සේ ඔහුට වදාළේ : | "මා අනුව එන්න" |
| ලෙවීගේ ප්‍රතිචාරය : | සියල්ල අත්හැර දමා නැගිට උන්වහන්සේ අනුව යෑම |
| කෘතගුණ දක්වීම සඳහා ලෙවී : | සිය නිවසෙහි ජේසුස් වහන්සේට භෝජන සංග්‍රහයක් පිළියෙල කිරීම. |
| එහි දී ජේසුස් වහන්සේට විරුද්ධව නැගුණු චෝදනාව : | උන්වහන්සේ අයකැමියන් හා පව්කාරයන් සමග කෑම වළඳන බව. |
| ජේසුස් වහන්සේගේ ප්‍රතිචාරය : | "රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදාගෙන් කම් නැත" කියාත් "මා ආයේ දමිටුන් පසුතැවී සිත් හරවා ගැනීමට කැඳවීම පිණිස නොවේ" කියාත් ය. |

"ලෙවී කැඳවීමේ සිද්ධියෙන් ඔබ අවබෝධ කර ගත්තේ කුමක් ද?" සුමුදු අක්කාගේ පැනය විය. "අප කෙතරම් වැරදි කර දෙවිඳුන්ගෙන් ඈත් වුවත් කමාව ලැබීම තුළ අපටත් දේව කැඳවීම යම් මොහොතක ලැබිය හැකියි" දෙව්ශානී කීවා ය.
"ජේසුස් වහන්සේගේ කැඳවීම ලැබෙන්නේ තම වැරදි පිළිගෙන පසුතැවිලි වන අයට ය." යන්න චතුරගේ අදහස විය.
සඳුනි පැවසූයේ "ජේසුස් වහන්සේ වැඩියේ ධර්මිෂ්ඨ අය නොව අප වැනි පව්කාරයන් කැඳවීමට" බව ය.
"දේව කැඳවීමට ක්ෂණික ව නිසි ප්‍රතිචාර දක්විය යුතු" බව මහෙල්ගේ අදහස විය.
සුමුදු අක්කා පැවසූයේ "දේව කැඳවීමට විවෘත වන අප, එම කැඳවීමේ ආශීර්වාදය අප කෙරෙහි පමණක් තබා නොගෙන අන් අයට ද එය ලබා දීම සඳහා කටයුතු කළ යුතු බව ය.

මෙලෙස ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකත්වයට ගලීලයේ මුහුද හෙවත් ගෙනසෙරෙත් විල අසල දී සීමොන්, අන්ද්‍රෘ, ජොහාන්, ජාකොබ් ද බදුපොළේ සිටි ලෙවී හෙවත් මතෙව් ද කැඳවූ සේක.

"හොඳයි මේ සිදුවීම් ඇසුරින් දැන් ඔයාලට පුළුවන් ද බලන්න, දේව සේවය සඳහා කැඳවීම ලබන අය තුළ තිබිය යුතු ගුණාංග කීහිපයක් පෙළගස්වන්න" සුමුදු අක්කා විමසුවා ය. ළමයි යුහුසුළු ව පිළිතුරු දීමට ඉදිරිපත් වූහ. සුමුදු අක්කා විසින් ඒ සඳහා ඔවුනට කාඩ්පත බැගින් ලබා දෙන ලදි. ඔවුන් ලියා දැක්වූ ගුණාංග පහත දැක්වේ.

| පසු තැවීම | නිහතමානිකම | කීකරුකම | ඇදහිල්ල | අවංකකම |
|---|---|---|---|---|
| (ශු. ලූක් 5:8) | (ශු. ලූක් 5:5) | (ශු. ලූක් 5:5) | (ශු. ලූක් 5:6) | (ශු. ලූක් 5:8) |

ශ්‍රාවකයන් කැඳවනු ලබන්නේ කුමකට ද? සුමුදු අක්කා ළමයින්ගෙන් තවත් ප්‍රශ්නයක් නැගුවා ය.
"ජේසුස් වහන්සේගේ ප්‍රේරිතයන් ලෙස කටයුතු කිරීමට" එවර පිළිතුරු දුන්නේ ගීතානි ය.
"ඔව් ගීතානි ඔයාගේ පිළිතුර හරි. ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් අතුරෙන් විශේෂ පිරිසක් තෝරාගත් බව අදාළ ශුද්ධ ලියවිලි කොටසෙහි සඳහන් වෙනවා".
ප්‍රේරිතයන් ලෙස අපි දැන් එය ශුද්ධ බයිබලයෙන් කියවා බලමු.

**විමසුමට**
**ශු. බයිබලයෙන්**
**ශු. ලූක් 6:12-16**

ඉන් පසු සුමුදු අක්කා තම අත රැඳි තවත් කාඩ්පතක් ළමයින්ට ඉදිරිපත් කළා ය. ප්‍රේරිතයන් දෙළොස් දෙනා කැඳවීම පිළිබඳ ව එකිනෙකා සිතන කරුණු එහි සටහන් කරන ලෙස ඇය පැවසුවා ය.

**ප්‍රේරිතයන් දොළොස් දෙනා කැඳවීමේ සිදුවීම තුළ දක්නට ඇති විශේෂ ලක්ෂණ :-**

චතුර - ශ්‍රාවකයන් කැඳවීමට පෙර ජේසුස් වහන්සේ කන්දකට නැඟී මුළු රැයක් පුරා යාච්ඤා කළ බව
දෙව්ශානි - තමා සමග සිටි අය අතුරෙන්, විශේෂ ශ්‍රාවකයන් දොළොස් දෙනෙකු පමණක් තෝරා ගත් බව
මහේල් - කෙතරම් පිරිසක් සිටිය ද විශේෂ ශ්‍රාවකයන් දොළොස් දෙනෙකු පමණක් තෝරා ගත් බව
ගීතානි - ජේසුස් වහන්සේ විශේෂයෙන් තෝරා ගත් ශ්‍රාවකයන් දොළොස් දෙනා හට "ප්‍රේරිතයන්" යන විශේෂ නාමය තැබූ බව
සඳුනි - විවිධ පරිසරවලට අයත්, විවිධ සමාජ පසුබිම් ඇති හා විවිධ රැකියාවල යෙදී සිට පැමිණි දොළොස් දෙනෙකු සිය ප්‍රේරිතයන් වීම සඳහා උන්වහන්සේගෙන් කැඳවීම් ලද බව.

ඔබ ලියූ අදහස් සෑම අදහසක් ම නිවැරදියි, ඒ වගේ ම ඉතා වැදගත්.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මා දැන් ඔබට කියා දෙන්නම්, ජේසුස් වහන්සේ මේ සිදුවීමෙන් අපට අවධාරණය කරන සත්‍යතා කිහිපයක්.

| | |
|---|---|
| වැදගත් තීරණවල දී → | යාච්ඤාවෙන් සවිමත් වීම අත්‍යවශ්‍ය බව |
| විවිධ පුද්ගලයින් උදෙසා → | සේවය සඳහා විවිධ අවස්ථාවල කැඳවීම ලැබෙන බව |
| දේව කැඳවීම ලබා දෙන්නේ → | දේව කැමැත්තට අනුකූල ව බව |
| දේව සේවයේ දී → | සංඛ්‍යාව නොව වැදගත් වන්නේ, දේව හඬට සවන් දී ඉටු කරන සේවාව බව |
| දේව කැඳවීම ලද කල → | අවනත වී ධනාත්මක ව ප්‍රතිචාර දැක්වීම අපේක්ෂිත බව |
| දේව කැඳවීම පිළිගන්නා අය → | ලෝකයට පිටත් කර යැවීම සඳහා ශුද්ධාත්ම බලය තුළ සන්නද්ධ වීම අත්‍යවශ්‍ය බව |
| ශ්‍රාවකත්වය සඳහා දේව කැඳවීම ලැබීමට → | තරාතිරම, පසුබිම, සමාජ තත්ත්වය ආදී කිසිවක් අදාළ නොවන බව |

**ජේසුස් වහන්සේගේ ප්‍රේරිතයන් ලෙස කැඳවීම ලැබූ දොළොස් දෙනාගෙන්,**

| | |
|---|---|
| සීමොන් පේදුරු හා ඔහුගේ සහෝදර ඇන්ඩෘ → | ධීවරයෝ වෙති |
| සෙබදීගේ පුතුන් වූ ජාකොබ් හා ජොහාන් → | ධීවරයෝ වෙති |
| පිලිප් → | පන්දහසකට කෑම දීම සිදුවීමේ දී අපට හමුවේ |
| බර්තොලමෙව් → | පිලිප් විසින් ජේසුස් වහන්සේ වෙත හඳුන්වා දී ඇත. නතානියෙල් ලෙස ද හැඳින්වේ |
| මතෙව් හෙවත් ලෙවී → | අයකැමියෙකි |
| තෝමස් → | උත්ථාන වූ ජේසුස් වහන්සේගේ ඇණ කැළැල් දක ඇදහූ තැනැත්තා ය |
| අල්පෙවුස්ගේ පුත් ජාකොබ් → | ලෙවීගේ සහෝදරයකු බව පැවසේ |
| අන්ත ජාතිවාදී සීමොන් → | සෙලඩ්වරයෙකි |
| ජාකොබ්ගේ පුතු ජූදස් → | සමහර අවස්ථාවල දී තද්දෙයුස් ලෙස හඳුන්වා ඇත |
| ජූදස් ඉස්කාරියොත් → | ජේසුස් වහන්සේ පාවා දුන් ශ්‍රාවකයා ය. ඔහු ගලීල වැසියෙක් නොවේ |

මොවුහු සිය කැඳවීම තුළ ජේසුස් වහන්සේ සමග සිටිමින් සේවයේ යෙදුණාහ. "අපිත් දේව කැඳවීමට නිසි ප්‍රතිචාර දක්වමින් දේව සේවයට කැපවෙමු" යි පවසමින් සුමුදු අක්කා දෙව් යැදුමකින් ශුද්ධ බයිබලය අධ්‍යයනය කිරීමේ කාලය අවසන් කළා ය. එදින ළමයින් නිවෙස් බලා ගියේ මුල් ශ්‍රාවකයන් කැඳවීමේ සිදුවීම තුළ දේව කැඳවීමට නිසි ප්‍රතිචාර දක්විය යුතු ආකාරය පිළිබඳ ව නව අත්දැකීමක් ලබා ගනිමිනි.

**ක්‍රියාකාරකම**

1. දේව කැඳවීම යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? අදහස් දක්වන්න.
2. ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන් කැඳවීමේ ක්‍රියාවලිය තුළ දක්නට ලැබුණු ලක්ෂණ පෙළගස්වන්න.
3. ඔබට දේව කැඳවීම ලැබුණොත් ඔබ ක්‍රියා කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.